**ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාව - 2023**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ 20223 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ඒරාවූර්පත්තු ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වැඩ අවසන් කළ ඉදිකිරීම් 05ක වටිනාකම රු. 3,189,344ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | ගිණුම් නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී පුස්තකාල 07කට පරිත්‍යාග ලැබුණු රු.543,386ක් වටිනා පොත් 1,575ක් සහ වටිනාකම සඳහන් නොවූ පොත් 784ක වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි කාලයේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයට යුනොප්ස් ස්වේච්ඡා සංවිධානයෙන් පරිත්‍යාග ලෙස ලබාදුන් වර්ග 22ක භාණ්ඩ 42ක වටිනාකම් සමාලෝචිත වර්ෂ අවසාන දිනටත් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | තක්සේරු කිරීම් අවසන් වූ පසු මෙම වටිනාකම් ගිණුම්වල අනාවරණය කරන බව. | -එම- |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.146,185,023 ක් වටිනා ගිණුම් ශේෂ 03 කට අදාල ස්ථාවර වත්කම් ලේඛනය, හිමිකාරිත්වය සනාථ කිරීම් ලේඛන, අත්තිකාරම් ලේඛනය සහ අනෙකුත් ලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ලිඛිත සාක්ෂි ලැබී තිබූ වත්කම්, ලේඛනයේ ලේඛනගත කළ නමුත්, එහි තථ්‍ය වටිනාකම ලේඛනවල දැක්වීමට කටයුතු කරන බව. | වත්කම්වලට අදාල ලිඛිත සාක්ෂි ලබාගැනීමට සහ ලේඛනවල ඇතුළත් කිරීමටත් පියවර ගතයුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය | සභාව සතු මාර්ග ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කර නොතිබුණි. | සියළුම මාර්ග ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරීමට අවශ්‍ය අනෙකුත් ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මාර්ග ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කිරිමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මුදල් රෙගුලාසි 371(2)(ආ) | සභාව විසින් පසුගිය සහ සමාලෝචිත වර්ෂය තුළ ලබාදුන් තත්කාර්ය අත්තිකාරම් රු.7,514,755ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිරවුල් කර නොතිබුණි. | අත්තිකාරම් නිරවුල් කිරීමට පියවර ගන්නා බව. | අත්තිකාරම් ගෙවීම් නිරවුල් කිරිමට පියවර ගත යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 571(1), (2) හා (3) | කල් ඉකුත් වූ තැන්පතු රු.14,645,166ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. | වර්ෂ 02ක් ඉක්ම වූ තැන්පතු අදාල පුද්ගලයින්ට ලිඛිතව දන්වා ඉන් පසුව ආදායමට මාරු කිරීමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 74,514,887ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.97,152,572 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාව විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,004,500 | 1,044,706 | 55,200 | 989,506 | 2,004,500 | - | - | 992,082 |
| කුලී | 15,755,000 | 17,021,021 | 14,177,491 | 2,843,529 | 15,370,000 | 11,457,854 | 14,607,772 | 5,484,204 |
| බලපත්‍ර ගාස්තු | 4,511,000 | 3,421,481 | 3,421,481 | - | 3,726,000 | 3,089,967 | 3,089,967 | - |
| වෙනත් ආදායම් | 8,874,500 | 10,409,074 | 10,409,074 | - | 50,712,000 | 57,159,616 | 58,159,616 | 2,609,529 |
| | 31,145,000 | 31,896,282 | 28,063,246 | 3,833,035 | 71,812,500 | 71,707,437 | 75,857,355 | 9,085,815 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **කුලී** | | |
| (i) | බදු පදනමට කඩකාමර ලබා ගත් බදුකරුවන් 52කගෙන් හිඟ බදුකුලී රු.1,604,779ක් අය කිරීමට ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | බදු කුලී හිමියන්ගෙන් හිඟ මුදල් අයකිරිමට ලිඛිතව දැනුම්දීම් සිදු කර ඇති බව. | හිඟ හිටි බදු අයකර ගැනීමට නොපමාව කටයුතු කළ යුතුය. |
| (ii) | 2023 දෙසැම්බර් 31 දින දක්වා ලංසු මත බදු දුන් දේපළ 18කින් ලැබිය යුතු රු. 1,238,751ක් වර්ෂ 01ක සිට වර්ෂ 03ක් දක්වා කාල පරාසයක හිඟහිටිව පැවැති අතර මෙම මුදල් අයකිරිමට පියවර ගෙන නොතිබුණි. | ලිඛිතව දැනුම්දීම් සහ ආදායම් පරීක්ෂකවරුන් ඍජුව ගොස් අයකිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව. | -එම- |
| **(ආ)** | දුරකථන සන්නිවේදන කුළුණු සඳහා අයකළ යුතු වෙළෙඳ බලපත්‍ර ගාස්තු රු.120,000ක් සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් අය කිරිමට පියවර ගෙන නොතිබුණි. | අය කළයුතු බලපත්‍ර ගාස්තු පිළිබඳව ලිඛිතව අදාල සමාගම් වෙත දැනුම් දී ඇති බව. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.56,379,248 ක් විය. | ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව. | ලැබිය යුතු ආදායම් නොපමාව අයකර ගැනීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1992 සැප්තැම්බර් 30 දිනැති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශයට පත්කළ අංක 1769 දරන පොදු චක්‍රලේඛය ප්‍රකාරව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට තනි මහලක් සඳහා පමණක් සැලැසුම් ඇඳිය හැකි වුවත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් විසින් සකස් කළ දෙමහල් ගෘහ නිර්මාණ සැලැසුම් 08 ක් සභාව අනුමත කර තිබුණි. | ඔබ විසින් අනාවරණය කළ චක්‍රලේඛය ප්‍රකාරව ඉදිරි කාලයේදී පියවර ගනු ලබන බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව පියවර ගත යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙනත් රාජ්‍ය ආයතනවලින් පරිත්‍යාග වශයෙන් ලැබූ වාහන, ට්‍රේලර් සහ බවුසර් ඇතුළුව වාහන 19 ක් සභාව විසින් පරිහරණය කර තිබූ නමුත්, ඒවා සභාවේ නමට හිමිකාරිත්වය මාරුකිරීමට පියවර ගෙන නොතිබුණි. | වාහනවල අයිතිය මාරු කිරීමට වර්තමාන යේ කටයුතු කරමින් පවතින බව. | සභාව සතු වත්කම් නිරවුල් කරගත යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛයේ 1.2 ඡේදය ප්‍රකාරව, පළාත් සභාව සහ පළාත් පාලන ආයතන මාර්ග ඉදිකිරීමේදී බොරළු දැමීම සහ තාවකාලික මාර්ග ඉදිකිරීම වැනි ක්‍රියාවන් වලක්වා දීර්ඝකාලයක් භාවිතා කළහැකි කාපට් දැමීම, තාර දැමීම හෝ කොන්ක්‍රීට් දැමීම ආදිය සිදුකළ යුතු බවට සඳහන් වුවද, සභාව විසින් චක්‍රලේඛයට අනනුකූලව සමාලෝචිත වර්ෂයේ රු.1,497,825ක කොන්ත්‍රාත් පිරිවැයක් යටතේ මාර්ග 04කට බොරළු දැමීම සිදුකර තිබුණි. | මහජනතාවගේ අවශ්‍යතාවට අනුව, ගරු ආණ්ඩුකාරවරයාගේ, ප්‍රාදේශීය සංවර්ධන කමිටු සභාපති හා දිස්ත්‍රික් සංවර්ධන කමිටු සභාපතිවරුන්ගේ අනුමැතිය සමග මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබූ බව. | චක්‍රලේඛය ප්‍රකාරව, දීර්ඝකාලයක් භාවිතා කළහැකි මාර්ග ඉදිකිරිමට පියවර ගත යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්ය මණ්ඩල ලැයිස්තු ප්‍රකාරව සභාවේ පැවැති තනතුරු 12ක් සඳහා පුරප්පාඩු 19ක් සහ අතිරික්තව සේවකයින් 01ක් විය. | කාර්ය මණ්ඩලය පිළිබඳව සභාව විසින් අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | පුරප්පාඩු පිරවීමට සහ අතිරික්ත සේවකයින් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමර්ග ගැනීමත් සිදු කළ යුතුය. |
| **(ආ)** | ස්ථානමාරුවී ගිය සේවකයෙකුගෙන් අයකළ යුතු හිඟණය රු.97,863ක් අදාල පුද්ගලයාගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකිරීමට සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සේවකයාගෙන් අයකළ යුතු ණය ශේෂ පිළිබඳව ලිඛිතව දැනුම්දීමට නියමිත බව. | හිඟ සේවක ණය අය කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 පාරිසරික ගැටළු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2008 පෙබරවාරි 01 දිනැති අංක 1534/18 දරන ගැසට් පත්‍රයේ 08 වගන්තිය ප්‍රකාරව, පරිසර ආරක්ෂණ බලපත්‍ර (EPL) කල් ඉකුත් වීමට මාස 03කට ප්‍රථම අළුත්කිරිමට ඉල්ලුම් කළ යුතුය. එසේ වුවත්, ආයතන 61ක බලපත්‍ර කල් ඉකුත්වී තිබූ නමුත් අළුත්කිරිමට පියවර ගෙන නොතිබුණි. | ඉදිරියේදි අළුත් කිරීමට ක්‍රියාමාර්ග ගන්නා බව. | පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත්කිරිමට පියවර ගත යුතුය. |